# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2202/17 - 2020 නොවැම්බර් මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2020.11.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වැනි වගන්තිය සමග කියවිය යුතු 41 වැනි වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නාමල් රාජපක්ෂ (පා.ම.),**
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය.

2020 නොවැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2020.04.30 වැනි දින නිකුත් කරන ලද 2173/13 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජාතික ක්‍රීඩා සංගම් නියෝග මගින් සංශෝධිත 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත සඳහන් පරිදි 2020 වර්ෂයට පමණක් බල පැවැත්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

01. 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* III වන උපලේඛනයේ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල ව්‍යවස්ථාවට අදාළ විධිවිධාන යටතේ (අ) ඡේදයේ මැයි මස 31 වැනි දිනය යන වචන ඉවත් කොට නොවැම්බර් මස 30 වැනි දිනය යන වචන ආදේශ කිරීමෙන් ;

02. 2021 වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින සිට නැවත 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* III වන උපලේඛනයේ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල ව්‍යවස්ථාවට අදාළ විධිවිධාන යටතේ (අ) ඡේදය වලංගු වනු ඇත ;

03. 2020.04.30 වැනි දින හා අංක 2173/13 දරන *අති විශේෂ ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරනු ලැබේ.

11 - 378